නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ව්‍යාපාර අධ්‍යයනය - 12 ශ්‍රේණිය

## ඒකක පරීක්ෂණය - 01 (ව්‍යාපාර පදනම)

නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

## (I) වන කොටස

**නිවැරදි පිළිතුර තෝරන්න.**

(01) මිනිස් අවශ්‍යතා හා වුවමනාවලට අදාළ ප්‍රකාශය කිපයක් පහත දැක්වේ.
මින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

i. අවශ්‍යතා සඳහා විකල්ප ඇත. වුවමනාව සඳහා විකල්ප නැත.

iii. මිනිස් අවශ්‍යතා අනිවාර්‍ය වේ. වුවමනාව අනිවාර්‍ය නොවේ.

iii. අවශ්‍යතා නිර්මාණය කළ නොහැකිය. වුවමනා නිර්මාණය කළ නොහැකිය?

iv. සමාජ බලවේග මගින් වෙනස් කළ හැකිය. සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැකිය.

v. අවශ්‍යතා විවිධ වේ. වුවමනා විවිධ නොවේ.

(02) පහත වගුවේ දැක්වෙන්නේ ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් කිපයක් සහ ව්‍යාපාර වර්ග කිපයක්.

| ව්‍යාපාර වර්ග කිරීමේ පදනම් | ව්‍යාපාර වර්ග |
|---|---|
| 1. නිශ්පාදනයේ ස්භාවය | A – කෘෂි / කාර්මික / සේවා |
| 2. නිශ්පාදනයේ අංශ | B – භාණ්ඩ නිපදවන / සේවා නිපදවන |
| 3. හිමිකාරිත්වය | C – ප්‍රාථමික / ද්විතියික / තෘතිය |
| 4. අරමුණ | D – ලාභය / සුභසාධකය |
| 5. නිශ්පාදිතයේ ස්භාවය අනුව | E – පෞද්ගලික / පොදු |

ව්‍යාපාර වර්ග පදනම් වලට අනුකූලව ගැලපු විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

i. 1-A, 2-B, 3-C, 4-D, 5-E

ii. 1-A, 2-C, 3-E, 4-D, 5-F

iii. 1-C, 2-A, 3-D, 4-E, 5-B

iv. 1-C, 2-A, 3-E, 4-D, 5-B

v. 1-B, 2-A, 3-E, 4-C, 5-D

(03) ව්‍යාපාර ක්‍රියාවලිය යෙදුම් සහ නිමවුම් ක්‍රියාවලියකි. එම ක්‍රියාවලියට අයත් කාර්යයන් වන්නේ,

i. නිශ්පාදනය / අලෙවිකරණය / මූල්‍යණය / සැළසුම්කරණය

ii. සම්පත් ලබාගැනීම / නිෂ්පාදන ක්‍රම තීරණය කිරීම / මූල්‍යණය / තාක්ෂණික දැනුම යොදා ගැනීම

iii. නිශ්පාදනය / අලෙවිකරණය / මූල්‍යය / මානව සම්පත් කටයුතු / පරිපාලනය / පර්යේක්ෂණ හා සංවර්ධනය.

iv. සැලසුම්කරණය / සංවිධානය / මෙහෙයවීම / පාලනය

v. සැලසුම්කරණය / නිශ්පාදනය / මිලදී ගැනීම / අලෙවිකරණය

(04) පහත දැක්වෙන්නේ ව්‍යාපාර කෙරෙහි උනන්දුක් දක්වන පාර්ශවයන්ගේ අරමුණුය

A – ලාබය උපරිම කිරීම

B – ව්‍යාපාරයේ වර්ධනය

C – ඉහල වැටුප් ලබා ගැනීම

D – ව්‍යාපාරයේ වර්ධනය

ඉහත අරමුණු පිළිවෙලින් දැකිය හැක්කේ,

i. අයිතිකරුවන් හා ණයහිමියන්ගේය

ii. සේවකයින් හා අයිතිකරුවන්ගේය

iii. කළමණාකරුවන් හා සේවකයින්ගේය

iv. ණය හිමියන් හා කළමණාකරුවන්ගේය

v. පරිභෝගිකයින් හා සැළසුම්කරුවන්ගේය

(05) අර්ථිකයේ විවිධ අංශවලට අයත් ව්‍යාපාර කටයුතු කීපයක් පහත දැක්වේ. ඒ අතරින් සේවා අංශයට අයත් ව්‍යාපාර කටයුතු දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ධීවර කර්මාන්තය

ii. ඉදිකිරීම් කර්මාන්තය

iii. පළතුරු වගාව

iv. පතල් හා කැනිම්

v. වෙළඳාම් හා ප්‍රවාහන සේවා

(06) නව ව්‍යාපාර ප්‍රවනතාවයක් නොවන්නේ පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ද?

i. ගෝලියකරණය

ii. මහා පරිමාණ නිශ්පාදන

iii. විද්‍යුත් ව්‍යාපාර

iv. පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම

v. ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම.

(07) පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසර බලවේග කීපයකි.

A. ප්‍රජා පරිසරය F. සේවකයන්

B. ගනුදෙනු කරුවන් G. ස්වාභාවික පරිසරය

C. අයිතිකරුවන් H. සංවිධාව ව්‍යුහය

D. ආර්ථික පරිසරය I. කළමණාකරුවන්

E. තරඟකරුවන් J. විභව ව්‍යාපාරිකයින්

ඉහත පරිසර බලවේග අතරින් ආසන්න පරිසර බලවේග ඇතුළත් කාණ්ඩය වන්නේ

i. A D G ii. C F H iii. D E I iv. B E J v. C F I

(08) ව්‍යාපාරයකට බලපෑම් ඇතිකරන සුවිශේෂී සංවිධාන හෝ කණ්ඩායම්

i. සාර්ව පරිසරයට අයත්වේ

ii. බාහිර පරිසරයට අයත්වේ

iii. පොදු පරිසරයට අයත්වේ

iv. අභ්‍යයන්තර පරිසරයට අයත්වේ

v. ආසන්න පරිසරයට අයත්වේ

(09) පහත දැක්වෙන්නේ ව්‍යාපාර පරිසරයට අයත් බලවේග කීපයකි.

A. ව්‍යාපාරය සතු සම්පත් B. සැපයුම්කරුවන්

C. විභව ආයෝජිකයින් D. කළමණාකරුවන්

E. සංවිධානමය සංස්කෘතිය F. තරඟකරුවන්

මේවා අතරින් ව්‍යාපාරයට අවස්ථා සහ තර්ජන ඇතිකරන බලවේග පමනක් ඇතුළත් පිළිතුර වන්නේ

i. A B C ii. B D F iii. B C F iv. A D E v. B D E

(10) මෙහි දැක්වෙන වගුවේ X තීරුව මඟින් ව්‍යාපාර සර්ව පරිසර බලවේගද Y තීරුව මඟින් ඊට අදාළ නිදසුන් කීපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ආර්ථික පරිසරය | A. සේවානියුක්ති, ආදායම් විෂමතා |
| 2. ප්‍රජා පරිසරය | B. ගෘහ රටා, අධ්‍යපන මට්ටම් |
| 3. දේශපාලන පරිසරය | C. වෙළෙඳ ගිවිසුම්, වෙළෙඳ හවුල් |
| 4. ගෝලීය පරිසරය | D. අයවැය ප්‍රතිපත්ති, විදේශ ප්‍රත්පත්ති |
| 5. තාක්ෂණික පරිසරය | E. අන්තර්ජාලය, රූපවාහිනීය |

සාර්ව පරිසර බලවේග හා නිදසුන් නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | 1-D | 2-B | 3-A | 4-E | 5-C |
| ii. | 1-A | 2-B | 3-D | 4-E | 5-C |
| iii. | 1-D | 2-A | 3-C | 4-A | 5-B |
| iv. | 1-A | 2-B | 3-D | 4-C | 5-E |
| v. | 1-B | 2-A | 3-C | 4-D | 5-E |

**අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයිමේදි සුදුසු වචන යොදා හිස්තැන පුරවන්න.**

(11) තමාට අවශ්‍ය දේ තමාම නිෂ්පාදනය කර ගැනීම .................................................................................... ................................................................ ලෙස හඳුන්වන අතර වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම ............................................................................................................ ලෙස හඳුන්වයි.

(12) සම්පත් භාණ්ඩ හෝ සේවා බවට පත්කිරීමේ ක්‍රියාවලිය .................................................................... ලෙස හඳුන්වන අතර ගනුදෙනු කරුවන් අවශ්‍යතා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම .................................................................................... ලෙස හඳුන්වයි.

(13) ව්‍යාපාරයකට සම්පත් සැපයූ ලාභ හෝ පාඩු විද දරාගන්නා පාර්ශවය ................................................. ............................................ වන අතර ව්‍යාපාරික සැලසුම් සකස්කිරිම හා තීරණ ගනු ලබන පාර්ශවය .......................................................................................................................... වේ.

(14) කිසියම් ව්‍යාපාරයක් සඳහා ධනාත්මක ඇගයීම් හා හර පද්ධතියක් පැවතීම ව්‍යාපාරයට .............. ................................................................................................ වන අතර මනා හර පද්ධති චර්යා ධර්ම පද්ධති ස්ථාපිත නොවීම ............................................................................................................ කි.

(15) නිෂ්පාදනයේ ස්භාවය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැණිම් කර්මාන්තය ..................................... ............................................................ අංශයට අයත් වන අතර කර්මාන්ත මූලය අනුව වර්ග කිරිමේදී ............................................................................................................ අංශයට අයත් වේ.

**අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(16) භාණ්ඩ හා සේවා වල වෙනස්කම් හතරක් ලියන්න.

| භාණ්ඩ | සේවා |
|---|---|
| i. .......................................................................... | .......................................................................... |
| ii. .......................................................................... | .......................................................................... |
| iii. .......................................................................... | .......................................................................... |
| iv. .......................................................................... | .......................................................................... |

(17) ව්‍යාවසායක ගති ලක්ෂණ හතරක් ලියන්න.

i. ..........................................................................

ii. ..........................................................................

iii. ..........................................................................

iv. ..........................................................................

(18) ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා නම් කරන්න.

i. ..........................................................................

ii. ..........................................................................

iii. ..........................................................................

iv. ..........................................................................

(19) ව්‍යාපාරයක අභ්‍යයන්තර පරිසර සාධක හතරක් ලියන්න.

i. ..........................................................................

ii. ..........................................................................

iii. ..........................................................................

iv. ..........................................................................

(20) අර්ථික පරිසර සාධක හතරක් ලියන්න.

i. ..........................................................................

ii. ..........................................................................

iii. ..........................................................................

iv. ..........................................................................

# (II) වන කොටස

(1) ව්‍යාපාරවලට විවිධ අරමුණු කෙතරම් තිබුණද, ආර්ථිකයක පැවැත්මට ද ව්‍යාපාර ඉතා වැදගත් වේ. නිදසුන් හතරක් දක්වන්න.

(2) (අ) එදිනෙදා ව්‍යාපාර කටයුතු වලදී විද්‍යුත් වාණිජ්‍යය භාවිතාවන අවස්ථා සඳහා නිදසුන් දෙකක් දක්වන්න.

(ආ) විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු මොනවා ද?

(3) ඕනෑම ව්‍යාපාරයක් මගින් සිදුකරනු ලබන ප්‍රධාන කටයුතු දෙකකි. මෙම කටයුතු දෙක නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(4) නිමි ඇඳුම් නිශ්පාදනය කරන ආයතනයක ව්‍යාපාර ක්‍රියාවලිය රූපසටහනකින් දක්වන්න.

(5) ව්‍යාපාරයන් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව හතරක් නම්කර ඔවුන් ව්‍යාපාරයට වැදගත් වීමට බලපාන හේතු වෙන වෙනම ලියන්න.

(6) ''ව්‍යාපාර පරිසර අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට ප්‍රයෝජන අත්වේ'' පැහැදිලි කරන්න.

(7) ව්‍යාපාරයක සැපයුම්කරුවන් සහ තරඟකරුවන් ව්‍යාපාරයකට අවස්ථා හා තර්ජන ඇති කරන්නේ කෙසේදැයි වෙන වෙනම පැහැදිලි කරන්න.

(8) සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

(9) ''බොහෝ විට සාර්ව පරිසර බලවේග ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇති කිරීම තුළින් ව්‍යාපාර කෙරෙහි අවස්ථා හෝ තර්ජන මතු කරයි.'' නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

(10) සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවයක් පවතින බව නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

.